DOI : 10.31357/fhssmph.2011.00737

# සමකාලීන ශ්‍රී ලාංකේය ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනීය ප්‍රවණතාවන්

බාලසූරිය මුදියන්සේලාගේ ප්‍රේමලතා

0 1 FEB 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයයේ

දර්ශන සූරි පරීක්ෂණය සඳහා සමාජ විද්‍යාව විෂය යටතේ

ඉදිරිපත් කරන නිබන්ධයයි.

## පර්යේෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ආචාර්ය දයලාල් අබේසේකර මහතා සහ මහාචාර්ය ටෙනිසන් පෙරේරා යන මහත්වරුන්ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් සඳහා හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන :- ........................ දිනය:- 2011/01/31

# නිර්දේශය

සමකාලීන "ශ්‍රී ලාංකේය ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනීය ප්‍රවණතාවන් " නැමති මෙම නිබන්ධය පිළිබඳ 2010.11.12 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පැවති වාචික පරීක්ෂණයේදී නිබන්ධ පරීක්ෂක මණ්ඩලය විසින් පෙන්වා දී ඇති සියලු සංශෝධන නිසි පරිදි සංස්කරණය කර ඇති බවත්, මෙම සංශෝධිත නිබන්ධ පිටපත් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට භාර දීමට සුදුසු තත්වයක පවතින බවත් සහතික කරමු.

පරීක්ෂක - මහාචාර්ය දයා අමරසේකර. DayaAmarasekera.
2011.01.13

1. උපදේශක - මහාචාර්ය ඩී.ඒ. ටෙනිසන් පෙරේරා.

2. උපදේශක - මහාචාර්ය දයාලාල් අබේසේකර.

## උපදේශක තුමන්ලාගේ නිර්දේශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

| | |
|---|---|
| ............................................ | ............................................ |
| Prof. B. A. [illegible] | Prof. D.S.D.J. Abeysekera |
| 2011/2/1 | 2011/2/1 |

# <u>අධ්‍යයනාංශ ප්‍රධාන තුමාගේ ප්‍රකාශය</u>

ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ දර්ශන සූරි උපාධිය සම්පූර්ණ කිරීම සඳහා මෙම පර්යේෂණ නිබන්ධය ඉදිරිපත් කර ඇති බව මෙයින් සහතික කරමි.

අත්සන :-.............................. දිනය:- 2011.02.01

අධ්‍යයනාංශ ප්‍රධාන තුමා

# පටුන

**මාතෘකාව** | **පිටුව**


| මාතෘකාව | පිටුව |
|---|---|
| මාතෘකාව | i |
| පර්යේෂකයාගේ ප්‍රකාශය | ii |
| නිර්දේශය | iii |
| උපදේශක තුමාගේ ප්‍රකාශය | iv |
| අධ්‍යයනාංශ ප්‍රධාන තුමාගේ ප්‍රකාශය | v |
| පටුන | vi - xi |
| ස්තුතිය | xii |
| සාරාංශය | xiii |
| හැඳින්වීම | 1 - 5 |
| **1 වැනි පරිච්ඡේදය** | 6 - 27 |
| **ක්‍රමවේදය සහ අධ්‍යයන ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පසුබිම** | |
| 1.1 අධ්‍යයනයේ අරමුණ | 6 |
| 1.2 අධ්‍යයනයේ වැදගත්කම | 6 |
| 1.3 අධ්‍යයන ක්‍රමවේදය | 7 |
| 1.4 පර්යේෂණයේ සීමාකම් | 9 |
| 1.5 පර්යේෂණයේ නියැඳිය | 9 |
| 1.6 උපන්‍යාසය | 10 |
| 1.7 දත්ත විශ්ලේෂණය කළ ආකාරය | 10 |
| 1.8 පර්යේෂණ නියැඳියේ භූගෝලීය පසුබිම. | 12 |
| 1.9 සමාජ හා සංස්කෘතික පසුබිම. | 15 |
| 1.9.1 ජනගහන ලක්ෂණ. | 15 |
| 1.9.2 අධ්‍යාපන තත්වය. | 17 |
| 1.9.3 ආර්ථික ක්‍රියාවලිය හා රැකියා. | 18 |
| 1.9.4 දේශපාලන හා පරිපාලන ව්‍යුහය. | 24 |
| 1.9.5 සංස්කෘතික පසුබිම. | 26 |

**2 වැනි පරිච්ඡේදය** 28 -64

**හැඳින්වීම** 28

2.1 පවුල පිළිබඳ නිර්වචන 28

2.1.1 පවුලේ ප්‍රභවය,ව්‍යුහය සහ විවාහය 30

2.1.2 පවුලේ කාර්යයන් 33 - 37

2.1.3 ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පවුලෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 38 - 40

2.1.4 ග්‍රාමීය පවුල් ව්‍යුහය, විවාහය සහ කුල ක්‍රමය. 41 - 44

2.1.5 ආර්ථික කටයුතු සහ ඉඩම් භුක්තිය 44 - 45

2.1.6 ශ්‍රී ලාංකික ග්‍රාමීය පවුල් වල අපගමනික ප්‍රවණතාවන්. 45 - 47

2.2. අපගමනය 47 - 56

2.2.1 ආසියාවේ සහ යුරෝපයේ පවුල් ස්වභාවයන් සහ වර්තමානයෙහි දක්නට ලැබෙන අපගමනික ප්‍රවණතාවන්. 56 - 64

**3 වැනි පරිච්ඡේදය** 65 -117

**දත්ත විශ්ලේෂණය** 65

3.1 ග්‍රාමීය පවුලේ අපගමනික ප්‍රවණතාවන් නිර්ණය කිරීම. 65 -66

3.2 අධ්‍යයනය සඳහා තෝරා ගත් නියැදිය 67 - 68

3.3 නීත්‍යානුකුලව විවාහ වීමේ ප්‍රවණතාව 69 - 73

3.4 දික්කසාද, අතහැර යාම සහ වෙන්වී ජීවත්වීමේ ප්‍රවණතාව 73 - 79

3.5 පවුල් බිඳී යාමේ ප්‍රවණතාව 79 - 79

3.6 අනියම් සම්බන්ධතා සඳහා දක්වන ප්‍රවණතාව 80 -82

3.7 මව්වරු විදේශ ගත වීම නිසා ඇතිවී තිබෙන අපගමණික ප්‍රවණතාවන් 82 - 85

3.8 නියැදිගත පවුල් මත් පැන් වලට යොමු වීමේ ප්‍රවණතාව 85 - 87

3.9 (පවුල්) ඥාති සම්බන්ධතාවයන් කෙරෙහි දක්වන ප්‍රවණතාව 88 - 89

3.10 අපරාධකාරී චර්යාවන් කරා අපගමනය වීමේ ප්‍රවණතාව 90 -91

3.11 ගෘහ මූලිකයන් සහ ඔවුන්ගේ දෙමව්පියන් අතර ඉතා කිට්ටු කුලුපග සම්බන්ධතාවයන්හි දක්නට ලැබෙන ප්‍රවණතාව. 91 - 93

3.12 සාමාජිකයන් සිය දිවි නසා ගැනීමේ ප්‍රවණතාව 93 - 95

3.13 ළමා අපයෝජන සිදු වීමේ ප්‍රවණතාව 95 - 97

3.14 දරුවන් ව්‍යභිචාරයට ලක් වීමේ ප්‍රවණතාව 97 - 98

3.15 දරුවන් මානසික පීඩනයට පත් වීමේ ප්‍රවණතාව 98 - 99

3.16 බාලාපරාධ සිදුවීමේ ප්‍රවණතාව 99 - 100

3.17 අතීත හා වර්තමාන ග්‍රාමීය පවුල් සංසන්ධනාත්මකව බැලීමේදී වඩාත් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමේ ප්‍රවණතාව 100 - 101

3.18 නියැදිගත පවුල් වල හා ඔවුන්ගේ දෙමාපියන්ගේ පවුල් වල දරුවන් ලැබීමේ ප්‍රවණතාව 101 - 102

3.19 සමස්තයික අපගමනික තීව්‍රතාවය පිළිබඳ පුළුල් වර්ගීකරණය. 103 - 108

3.20 විවාහ ජීවිතයේ යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ ප්‍රවණතාව 108

3.21 විවාහ ජීවිත සතුටින් ගත කිරීමේ ප්‍රවණතාව. 109 - 110

3.22 පවුල තුළ නිදහස් ජීවිතයක් ගෙවීම සඳහා ඇති අවස්ථාව 110 - 111

3.23 දෙමාපියන් සිය දරුවන් කෙරෙහි දක්වන ආකල්ප 111 - 112

3.24 පවුලේ දළ මාසික ආදායම් තත්වය හා අපගමනීය තීව්‍රතාවය. 112 - 113

3.25 අපගමනික තීව්‍රතාවය හා ග්‍රාමීය පවුල් ස්ථාවරත්වය තහවුරු කරන සුලු තෝරා ගත් විචල්‍යයන් අතර සම්බන්ධතාවය. 113 - 116

**4 වැනි පරිච්ඡේදය** 117 - 123

නිගමන හා යෝජනා 117 - 123

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 123 - 129

**උප ග්‍රන්ථය.**

පවුල් ජීවිත පිළිබඳව සෘණාත්මක සහ ධනාත්මක ආකල්පීය ප්‍රත්‍යෙක විස්තර කථනයන් i - xii

**ප්‍රශ්නාවලිය** xiii - xxii

3.20 විවාහ ජීවිතයේ යුතුකම් හා වගකීම් ඉටු කිරීම සම්බන්ධ ප්‍රත්‍යෙක විස්තර. i -ii

3.21 විවාහ ජීවිත සතුටින් ගත කිරීම පිළිබඳ ප්‍රත්‍යෙක විස්තර. iii -viii

3.22 නිදහස් ජීවිතයක් ගෙවීම පිළිබඳ ප්‍රත්‍යෙක අධ්‍යයන තොරතුරු. viii - x

3.24 පවුලේ දළ මාසික ආදායම පිළිබඳ ප්‍රත්‍යෙක විස්තර xi - xii

## වගු හා සිතියම් විස්තර

**වගු අංකය**


1.9.1. ප්‍රදේශයේ මුලු ජනගහන ප්‍රමාණය ස්ත්‍රි, පුරුෂ භාවය අනුව 2008 — 15

1.9.2. ප්‍රදේශයේ ජන ව්‍යාප්තිය ජාතීන් අනුව 2008 — 16

1.9.3. ආගම අනුව ප්‍රදේශයේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය 2008 — 16

1.9.4 යාලව ග්‍රාම සේවා වසමේ නිවැසි ජනගහනයේ වයස් සංයුතිය, 2008 — 17

1.9.2.1 යාලව ග්‍රාම සේවා වසමේ නිවැසියන් ගේ අධ්‍යාපන සාධන මට්ටම, 2008 — 17

1.9.2.2 යාලව ග්‍රාම සේවා වසමේ නිවැසියන්ගේ අධ්‍යාපන මට්ටම අනුව සේවා නියුක්ත සහ වියුක්ත තත්වය, 2008 — 18

1.10.1 යාලව ග්‍රාම සේවා වසමේ ජනගහනයට අනුව විවිධ ක්ෂේත්‍ර ඔස්සේ රැකියා බෙදී යාම, 2008 — 19

1..10.2 ප්‍රදේශයේ කෘෂිකාර්මික භෝග සඳහා වෙන් කොට ඇති භූමි ප්‍රමාණය සහ නිෂ්පාදිත ප්‍රමාණයන් දළ වශයෙන්, 2008 — 22

1.10..3 යාලව ග්‍රාම සේවා වසමේ පවුල් වල මාසික ආදායම් මට්ටම, 2008 — 23

1.10.4 ප්‍රදේශයේ සමෘද්ධි සහනාධාර, මහජන ආධාර ලබන්නන් සහ ඒවා අපේක්ෂා කරන්නන් පිළිබඳව සංඛ්‍යා දත්ත, 2008 — 23

3.2.1 තෝරාගත් අධ්‍යයන නියැදිය ගම් වශයෙන්. — 67

3.2.2 ස්ත්‍රි/ පුරුෂ භාවය අනුව ගෘහ මූලික සංඛ්‍යාව. — 68

3.2.3 නියැදිගත ගෘහ මූලිකයන්ගේ වයස් ව්‍යුහය — 68

3.3.1 නියැඳිගත පවුල්වල විවාහයේ නීත්‍යානුකූල ස්වභාවය — 69

3.3.2 විවාහයේදී තම කුලය ආරක්ෂා කර ගැනීමේ ප්‍රවණතාව — 70

3.3.3 කුලය ආරක්ෂා නොකිරීම නිසා ඥාති සම්බන්ධතා වලින් දරුවන් බැහැර කොටඇති පවුල් — 72

3.3.4 පවුල් වල විවාහයෙන් පිට දරුවන් ලැබීම පිළිබඳ තොරතුරු 73

3.4.1 පවුල් වල විවාහයේ දැනට පවතින තත්වයන් (දික්කසාද,අතහැර යාම,වෙන්වී ජීවත්වීම) 74

3.5.1 බිඳුණු පවුල් සහ සාමාන්‍ය විවාහ ජීවිත ගත කරන්නන් 79

3.6.1 අනියම් සම්බන්ධතා කෙරෙහි දක්වන ප්‍රවණතාව 80

3.7.1 නියැදියේ මව්වරු/ගෘහණියන් විදේශ ගත වීම 83

3.8.1 නියැඳිගත ගෘහ මූලික පවුල් වල මත් පැන් සඳහා ඇබ්බැහි වීමේ ප්‍රවණතාව. 85

3.9.1 පවුල් වල ඥාති සම්බන්ධතා 88

3.10.1 ගෘහ මූලිකයන් අපරාධකාරී චර්යාවන් කරා යොමු වීමේ ප්‍රවණතාව 90

3.11.1 ගෘහ මූලිකයන් විසින් සිය දෙමව්පියන්ට විරුද්ධව සහ දෙමව්පියන් විසින් දරුවන්ට විරුද්ධව (ගෘහ මූලිකයින්ට ) පොලීසියට කරන ලද පැමිණිලි 92

3.12.1 සිය දිවි නසා ගැනීම හෝ ඒ සඳහා උත්සාහ දැරීම 94

3.13.1 ළමා අපයෝජන සිදුවීමේ ප්‍රවනතාව 95

3.15.1 විවිධ මානසික පීඩනයන්ට දරුවන් මුහුණ දීමේ ප්‍රවණතාව 98

3.16.1 බාලාපරාධ සිදුවීමේ ප්‍රවණතාව 100

3.17.1 පවුල් ජීවිතයේ තෘප්තිමත් භාවය (වර්තමාන සහ අතීත පවුල ආශ්‍රයෙන් ) 101

3.18.1 පවුල් වල ගෘහ මූලිකයන්ගේ සහ ඔවුන්ගේ දෙමව්පියන් ගේ දරුවන් සංඛ්‍යාව. 102

3.19.1 තෝරාගත් අපගමනික ප්‍රවණතා හා ඊට ප්‍රදානය කර ඇති ලකුණු ප්‍රමාණය. 104

3.19.2 අපගමනික නිර්ණායක සඳහා පවුල විසින් ලබා ගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය. 105

3.19.3 ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණය මත පවුල් වල අපගමනික තීව්‍රතා මට්ටම. 107

3.20.1 අපගමනික තීව්‍රතාවය හා පවුල් සාමාජිකයන් විසින් තම යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ ප්‍රවණතාව. 108

3.21.1 අපගමනික ප්‍රවණතාවන්ගේ තීව්‍රතා මට්ටම සහ පවුල් ජීවිතය සතුටින් ගත කිරීමේ ප්‍රවණතාව. 109

3.22.1 අපගමනික තීව්‍රතා මට්ටම සහ පවුල තුළ නිදහස් ජීවිතයක් ගත කිරීමේ ප්‍රවණතාව. 110

3.23.1 අපගමනික තීව්‍රතාවය හා දෙමාපියන් විසින් තම දරුවන් කෙරෙහි දක්වන සුභවාදී ආකල්ප. 111

3.24.1 අපගමනික තීව්‍රතාවය සහ පවුල් වල දළ මාසික ආදායම 113

3.25.1 අපගමනික තීව්‍රතාවය සහ ග්‍රාමීය පවුලේ ස්ථාවරත්වය තහවුරු කරන සුලු තෝරාගත් විචල්‍යයන් ගේ ප්‍රතිශතමය සාමාන්‍යය ඇසුරින් පෙන්නුම් කරන සහසම්බන්ධතාවය. 115

**සිතියම්**

01. යාලව ග්‍රාම සේවා වසමේ භූගෝලීය පිහිටීම දැක්වෙන සිතියම i

02. යාලව ග්‍රාම සේවා වසම දැක්වෙන දළ සිතියම ii

# ස්තූතිය

★ මෙම නිබන්ධය ලිවීමේදී උපදෙස් ලබා දෙමින් අඩුපාඩු සකස් කර ගැනීමට මග පෙන්වූ මහාචාර්ය දයලාල් අබේසේකර මහතාටත්,

★ පොත පත සපයා දෙමින් නිබන්ධයේ අඩු පාඩු සකස් කර ගැනීමට උපදෙස් ලබා දුන් මහාචාර්යය ටෙනිසන් පෙරේරා මහතාටත්,

★ අවශ්‍ය මග පෙන්වීම් සහ පොත පත සපයා දෙමින් කටයුතු කළ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතාටත්, විශ්ව විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයටත්,

★ අවශ්‍ය මග පෙන්වීම් සහ පොත පත සපයා දෙමින් කටයුතු කළ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය දයා අමරසේකර මහතාටත්,

★ අවශ්‍ය තොරතුරු ලබා දෙමින් නන් අයුරින් සහයෝගය දැක්වූ යාලව ග්‍රාම සේවා වසමේ ග්‍රාම නිළධාරී නවරත්න මහතා ඇතුලු ගම් වාසීන් සියලු දෙනාටත්,

★ පර්යේෂණ කටයුතු වලදී සහය දැක්වූ මුදුන්න මහා විද්‍යාලයේ ආචාරිනී ඊ.එම්. අනුලා ඒකනායක මෙනවිය සහ ඉන්දු ප්‍රියදර්ශනී, නිමාලි පුෂ්ප කුමාරි, චිත්‍රා ලාලනී යන ශිෂ්‍යාවන්ටත්,

★ නොයෙක් අයුරින් මෙම කාර්යය සඳහා උපකාර කළ මුදුන්න මහා විද්‍යාලයේ ආචාරිනී ඩී.එම්.එස්.පී දිසානායක, එච්. එම්. සීතා කුමාරි හේරත් සහ ඩී එම්. රංමැණිකේ යන මහත්මීන්ටත්

★ කු/ මුදුන්න මහා විද්‍යාලයේ විදුහල්පති ඩී. එම්. ජයතිලක මහතා ඇතුලු අධ්‍යයන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ සියලුම මහත්ම මහත්මීන්ටත් ,

★ කුරුණෑගල විදේශ සේවා නියුක්ති කාර්යාලයේ අධිපතිතුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත්,

★ මේ කාර්යය ආරම්භයේ සිටම මා දිරිමත් කරමින් කටයුතු කළ ජයසුන්දර මහතා සහ මාගේ එකම දියණිය හෂිණි මධුෂිකා ජයසුන්දරටත්,

**මාගේ ගෞරව පූර්වක ස්තූතිය**

# සාරාංශය

මෙම නිබන්ධයේ මාතෘකාව "ශ්‍රීලාංකේය සමකාලීන ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනීය ප්‍රවණතාවන් යන්නයි. මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යාලව ග්‍රාම සේවා වසමේ පවුල් 125 ක් යොදා ගෙන තිබේ. එම නිවාස තෝරා ගෙන ඇත්තේ වයස අවු. 35 -55 ත් අතර වයස් කාණ්ඩයේ පසුවන ගෘහ මූලිකයන්ගෙනි. මෙසේ තෝරා ගැනීමට හේතු වූයේ 1970 න් පසුව එළඹෙන දශක කීපය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පවුල් සංස්ථාවේ සමාජ ආර්ථික වශයෙන් විවිධ වූ වෙනස්කම් ඇති කිරීමට බලපා ඇති බැවිනි. ඒ අනුව ලංකාවේ ග්‍රාමීය පවුල් වල දක්නට ලැබෙන්නේ යැයි සිතිය හැකි හේතු කාරක ගණනාවක් යොදා ගනිමින් පර්යේෂණ උපන්‍යාසය වූ "ශ්‍රී ලංකාවේ සමකාලීන ග්‍රාමීය පවුල් වල අපගමනික ප්‍රවණතාවන් දකින්නට ලැබේ. " යන්න සනාථ කළ හැකි මට්ටමේ හේතු සාධක පවතීදැයි ගවේෂණාත්මකව සොයා බලා තිබේ. මූලික වශයෙන් එම හේතු කාරක සම්බන්ධයෙන් පැහැදිළි ස්ථිරසාර නිගමනයකට බැසීමට අසීරු වූයේ හැම කරුණක් සම්බන්ධයෙන්ම මන්දගාමී ලෙස අපගමනික ප්‍රවණතාවන් පෙන්නුම් කිරීමයි. ඒ නිසා ප්‍රබල ලෙස පවුලෙහි අපගමනික තීව්‍රතා ප්‍රදර්ශනය කෙරේ යැයි උපකල්පනය කරන ලද හේතු කාරක 17 ක් යොදා ගෙන ලකුණු පැවරීමක් මගින් අපගමණික තීව්‍රතාවය මත පවුල් වර්ග 03 කට බෙදා ගන්නා ලදි. මේ වර්ග කිරීමට අනුව ඉහළ, පහළ, සහ අවම වශයෙන් අපගමනික තීව්‍රතා ඔස්සේ පවුලෙහි ධනාත්මක යහපැවැත්ම සඳහා හේතු වන්නේයැයි සැළකිය හැකි චර්යාත්මක හා ආකල්පමය ගති ලක්ෂණ කීපයක් ද සංසන්දනාත්මකව විමසීමට භාජනය කරමින් වඩාත් පැහැදිලි නිගමනයකට බැසීමට උත්සාහ ගැනුණි. තව දුරටත් එම ගති ලක්ෂණයන්ගේ යහපත් වූ ධනාත්මක සංඛ්‍යාත්මක අගයන්හි එකතුව ඇසුරින් ලබා ගත් සමාන්‍යයන් තුළින් ද නිගමන සඳහා එළඹීමට උත්සාහ දරා තිබේ. පරිච්ඡේද හතරකින් ඉදිරිපත් කොට ඇති මෙම නිබන්ධයේ දත්ත විශ්ලේෂණයන් තුළින් බැසගත් නිගමන හා යෝජනාවන් අනුව ශ්‍රි ලංකාවේ ග්‍රාමීය පවුල් ශක්තිමත් කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් අදාළ අංශ වලට වැදගත් වේ යැයි විශ්වාස කරයි.

**වර්තමාන ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනීය ප්‍රවණතාවන්**
**බී.එම්. ප්‍රේමලතා.**
**නිබන්ධ සාරාංශය.**

## හැඳින්වීම

නිබන්ධය සඳහා මා විසින් තෝරා ගත් මාතෘකාව වූයේ "සමකාලීන ශ්‍රී ලාංකේය ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනීය ප්‍රවණතාවන්" යන්නයි. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දර්ශන සූරි උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි. මේ සඳහා මා විසින් වසර දෙකක කාලයක් තුළදී එනම් 2008 සහ 2009 යන වර්ෂ වලදී ගම් කීපයක් මුල් කරගෙන කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයක් යොදා ගෙන තිබේ. මාතෘකාවට අනුව ග්‍රාමීය පවුල් වල අපගමනීය ප්‍රවණතාවන් ලෙස සළකා බලන ලද්දේ අතීතයේ සිට මේ දක්වා පවුල් සංස්ථාව තුළ පැවති පිළිගත් සමාජ ආචාර ධර්ම වර්තමාන සමාජයේ පවුල් සංස්ථාව කෙරෙන් ඈත් වී යාමක් පෙන්නුම් කරන්නේ ද යන්නයි. එනම් පවුල් සංස්ථාවෙහි සාමාජිකයන්ගේ ශක්තිමත් පැවැත්මට බාධා කරනු ලබන සමාජයට අහිතකර ප්‍රතිඵල ගෙන දෙන්නා වූ තත්වයන් පවුල තුළ දක්නට ලැබේ දැයි සොයා බැලීමයි. ඒ යටතේ පවුල් සංස්ථාව දෙදරා යාම කෙරෙහි බලපාන දික්කසාද, අතහැර යාම්, වෙන්වී ජීවත්වීම යනාදී පැහැදිළි දෘශ්‍යාත්මක ප්‍රවණතාවන් මෙන්ම අමනාප වීම්, මානසික පීඩනයට ලක් වීම, දරුවන් අපයෝජනයට ලක් වීම, අපරාධ, සිරගත වීම්, කලකෝලාහල, බීමත්කම, අවතැන් වීම, දෙමාපිය දූ - දරු සම්බන්ධතාවයන් දුරස් වී යාම, සිය දිවි නසා ගැනීම හෝ ඒ සඳහා තැත් කිරීම, පවුලේ සාමාජිකයන්ගේ භූමිකාවන් වෙනස් වී යාම පවුලේ ශක්තිමත් පැවැත්මට හානි දායක වී තිබීම යනාදිය සළකා බලන ලදි. ග්‍රාමීය සමාජයේ පරම්පරා දෙකක තත්වයන් සසඳා බලමින් කාලයත් සමග පවුලෙහි ඉදිරි පැවැත්මට බාධාකාරී ලෙස බලපාන්නා වූ යම් ප්‍රවණතාවන් පවතින්නේ දැයි සොයා බලා ඇත. ඊට අමතරව අධ්‍යයන කටයුතු සඳහා යොදාගත් ගෘහ මූලිකයන් (ස්වාමියා - භාර්යාව ) සහ ඔවුන්ගේ දරුවන් අතර සම්බන්ධතාවයන් හි සමාජයට අහිතකර වූ යම් තත්වයක් පවතින්නේ ද යන්නත් සොයා බැලුනි. එමෙන්ම මව්වරු විදේශ ගත වීම නිසා ග්‍රාමීය පවුලෙහි ඇති වී තිබෙන සමාජයට අහිතකර වූ යම් ප්‍රවණතාවන් දක්නට තිබේදැයි තව දුරටත් විමසීමක් කර තිබේ.

කාලීන වශයෙන් පවුල් සංස්ථාවෙහි ඇති වී තිබෙන වෙනස්කම් අධ්‍යයනයට යොමු කිරීම සමාජ ආර්ථික වශයෙන් වැදගත් සේ සැළකෙන නිසා මෙම අධ්‍යයනය සමාජ විද්‍යාත්මකව වැදගත් කමක් උසුලන්නකි. අතීතයේ සිට මේ දක්වා පවුල්

සංස්ථාවෙහි යම් යම් වෙනස් කම් සිදු වී තිබේ. ඒ වෙනස්කම් සමාජයට හිතකර මෙන්ම අහිතකර ඒවා ද වේ. මෙම අධ්‍යයනයේ දී අවධානයට ලක් කරන ලද්දේ සමාජයට අහිතකර වූ යම් ලක්ෂණයන් වර්තමාන පවුල තුළ ප්‍රදර්ශනය කරන්නේ ද යන්න පිළිබඳවයි.

මෙම මාතෘකාව තෝරා ගැනීම සඳහා බලපාන ලද්දේ බොහෝ ග්‍රාමීය පවුල් වල විවිධ ගැටලුකාරී තත්වයන් උද්ගතව ඇති බවක් පෙනී යන හෙයිනි. විශේෂයෙන් මව් වරුන් විදේශගත වීම,බීමත්කම වැනි තත්වයන් නිසා පවුල තුළ දරුවන්ට අයහපත් තත්වයන් උදාවී ඇතුවාක් මෙන්ම ස්වාමියා භාර්යාව යන අයගේ විවාහ සම්බන්ධතාවයන් ද යම් තරමක් පලුදු වී යාම කෙරෙහි බලපා ඇති බැවිනි. එමෙන්ම කාලීනව ඇති වී තිබෙන ආර්ථික, සමාජ ව්‍යුහාත්මක වෙනස් කම් ද පවුල තුළ මෙතෙක් පැවති ආරක්ෂාකාරී භාවයට හානී ගෙන දෙන තත්වයක් සමාජය තුළින් දිස්වන නිසාය. ඒ නිසා වර්තමානයේ පවුල් සංස්ථාව තුළ සමාජයට යම් අහිතකර වූ තත්වයන් වර්ධනය වී යාමක් පෙන්නුම් කරන්නේ නම් ඒ සඳහා ක්‍රියා මාර්ග ගැනීමට ද මෙම අධ්‍යනය වැදගත් වේ යැයි සළකා මෙම මාතෘකාව තෝරා ගෙන තිබේ.

**<u>ක්‍රම වේදය සහ නියැදි සම්පාදනය :-</u>**

ගවේෂණයට පෙර ක්‍රමවත් සැළැස්මක් සකස් කර ගැනුනි. එහිදී ක්‍රම වේදය වශයෙන් සම්මුඛ පරීක්ෂණ ක්‍රමය ප්‍රධාන වශයෙන් යොදා ගෙන තිබේ. මීට අමතරව නිරීක්ෂණය තුළින් ද මාතෘකාවට අදාළ වැදගත් තොරතුරු අනාවරණය කර ගත හැකි විය. සම්මුඛ සාකච්ඡා මෙහෙය වීමේදී ඒ සඳහා ප්‍රවිශ්ට වීමක් ලෙස සම්මුඛ පරීක්ෂණ උපලේඛනයක් ලෙස ප්‍රශ්න මාලාවක් සකස් කර ගනිමින් අදාළ තොරතුරු පමණක් ලබා ගැනීමට උත්සාහ කර තිබේ. සම්මුඛ සාකච්ඡා සඳහා අදාළ නියැදියේ ගෘහ මූලිකයන් එනම් නිවසේ ස්වාමියා හෝ භාර්යාව අහඹු ලෙස යොදා ගනිමින් දත්ත රැස් කෙරුනි. මෙහිදී ගෘහ මූලිකයාම ඉලක්ක කරගෙන සම්මුඛ සාකච්ඡා මෙහෙය වීමට බලාපොරොත්තු වුව ද බොහෝ නිවෙස් වල දහවල් කාලයේ රැදී සිටියේ භාර්යාව පමණක් වීම නිසා අහඹු ලෙස ගෘහ මූලිකයා හෝ භාර්යාවගෙන් තොරතුරු ලබා ගැනීම ට පෙළඹුනෙමි. බොහෝ විට පෙනී ගියේ පුරුෂයින්ට වඩා ස්ත්‍රීන් දොඩමලු බවකි. එමෙන්ම පර්යේෂකයා කාන්තාවක් බැවින් සමීප ලෙස සත්‍ය තොරතුරු ලබා දීමට කාන්තාවන් පුරුෂයින් ට වඩා කැමැත්තක් දැක්වීය. එමෙන්ම දිවා

කාලයේ දී බීමත්ව සිටි ගෘහ මූලිකයන්ගෙන් සම්මුඛ සාකච්ඡා මෙහෙය වීම අසීරු කරුණක් ද විය. ස්වාමියා හා භාර්යාව යන දෙදෙනාම නිවසේ සිටියත් වැඩිපුර කතා බහ කිරීම සඳහා ඉදිරිපත් වූයේ ද භාර්යාවන්ය. තවත් තැනක ස්වාමි පුරුෂයා අදහස් දැක්වුව ද භාර්යාව ද එයට සහාය වූවාය. මේ අනුව සම්මුඛ සාකච්ඡා කිරීමේ දී ඔවුන්ගේ පවුලේ සාමකාමී වාතාවරණය පිළිබඳවත්, , කලකෝලාහල, බීමත්කම, විවාහ ජීවිත සතුටින් ගෙවන්නේ ද යන්නත්, ස්වාමියා - භාර්යාව අන්‍යෝන්‍ය සහයෝගයෙන් උදව් පදව් කරමින් ප්‍රීතිමත් ජීවිතයක් ගෙවන්නේ ද යන්නත් සොයා බලන ලදි. එමෙන්ම සාකච්ඡාවට භාජනය කළ ස්වාමියා හෝ භාර්යාව ගේ දෙමාපියන්ගේ විවාහ ජීවිත ඔවුන්ගේ විවාහ ජීවිත හා සසදා බලමින් අදහස් ප්‍රකාශ කිරීමට ද ඉඩ කඩ සළසා දෙන ලදි. තව දුරටත් ගෘහ මූලිකයින් ඔවුන්ගේ ඥාතීන් සමග සම්බන්ධතා පවත්වන ආකාරයේ යම් අපගමනය වීමක් පවතින්නේ දැයි සොයා බැලුනි. මෙයින් බලාපොරොත්තු වූයේ කාලයත් සමග පරම්පරාවෙන් පරම්පරාවට මාරු වී යාමේ දී පවුල් සංස්ථාව සමාජයට අහිතකර වූ අපගමනීය තත්වයන්ගේ බලපෑමට ලක් වෙමින් පවතින්නේ දැයි සොයා බැලීමයි. තව දුරටත් දෙමාපියන් හා දරුවන් අතර දැනට පවතින සම්බන්ධතාවයන් කුමන ආකාරයෙන් පවතින්නේ ද යන්න සොයා බලන ලදි. සම්මුඛ සාකච්ඡා වලදී පර්යේෂණ මාතෘකාවට සම්බන්ධ වැදගත් තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. ඇතැම් සුවිශේෂ සිද්ධීන් ප්‍රත්‍යෙක අධයනයන් (Case study ) ලෙසින් ද ගවේෂනයට භාජනය වී තිබේ.

ගවේෂණ නියැදිය ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යාලව ග්‍රාම සේවා වසමට අයත් ගම් කීපයක් යොදා ගන්නා ලදි.එම ග්‍රාම සෙවා වසමට අයත් ගම් කීපයකි. එනම් යාලව, උඩතිබ්බටුවාව, පල්ලෙ තිබ්බටුවාව, තලයාය හා රුක්අත්තන ජනපදයයි. ලාංකික ජන සමාජයේ 1970 න් පසුව එළඹෙන දශක කීපයේ දී මව්වරු විදේශ ගත වීම හා විවෘත ආර්ථිකය වැනි බලපෑම් නිසා සමාජ ව්‍යුහාත්මක වෙනස් කම් රැසක් ඇති කිරීමට හේතු වී තිබෙන බැවින් අධ්‍යයනය සඳහා ඉහත කාල වකවානුව තුළ විවාහකයන් ලෙස ගත කළ පවුල් පර්යේෂණයට භාජනය කිරීම සඳහා අදහස් කළෙමි. ඒ නිසා අදාළ ගෘහ මූලිකයන් සොයා ගැනීමේදී වයස් සීමාවක් මත පදනම් කර ගැනුණි. මේ අනුව වයස අවුරුදු 35 ත් 55 ත් අතර කාණ්ඩයේ ගෘහ මූලිකයන් සිටින පවුල් 125 ක් තෝරා ගන්නා ලදි. මේ පවුල් ප්‍රමාණය ඉහත වයස් කාණ්ඩයට අයත් ගමේ සියලුම පවුල්

වේ. එම පවුල් 125 ම අධ්‍යයනයේ නියැදිය ලෙස යොදා ගෙන තිබේ.

මේ සඳහා සකස් කර ගත් පර්යේෂණ සැළැස්මෙහි උපන්‍යාසය වශයෙන් යොදා ගෙන ඇත්තේ "සමකාලීන ශ්‍රී ලාංකේය ග්‍රාමීය පවුල් සංස්ථාවේ අපගමනික ප්‍රවණතාවන් දකින්නට ලැබේ." යන්නයි. එයට අනුව එකිනෙක පවුල් වල සමාජ පැවැත්මට අහිතකර වූ අපගමනික තත්වයන් පවතින්නේ දැයි සොයා බලා තිබේ. ඊට අමතරව නිගමන කරා එළඹීම සඳහා අපගමනික තත්වයන්ගේ තීව්‍රතාවය සළකා බලා උපකල්පනයක් මත තෝරා ගත් නිර්නායක 17 ක් ඔස්සේ ලකුණු ප්‍රදානය කිරීමකින් අපගමනික පවුල් වර්ග කර ගැනුනි. ඒ අනුව ඉහළ අපගමනික තලයේ පසුවන පවුල්, පහල අපගමනික තලයේ පසුවන පවුල් සහ අවම අපගමනික ප්‍රවනතාවයන් ට ලක්වූ පවුල් යනුවෙන් ආකාර 3 කට තීව්‍රතා මට්ටම් අනුව වර්ග කර ගනිමින් නියැදිය තුළ කුමන ප්‍රමාණයකින් අපගමනික ප්‍රවණතාවන්ට ලක් වී තිබේ දැයි අධ්‍යයනය කර තිබේ. එම වර්ගීකරණයන් සමඟ තව දුරටත් පවුලේ ගෘහ මූලිකයින්ගේ චර්යාමය හා සංකල්පීය තත්වයන් කීපයක් ද සංසන්දනාත්මකව අධ්‍යයනයට භාජනය කොට නිගමන කරා එළඹ තිබේ.

**පරිච්ඡේද සැකැස්ම :-**

මෙම හැඳින්වීමට අමතරව නිබන්ධය පරිච්ඡේද 4 කින් සමන්විත වේ. එනම් අධ්‍යයන ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පසුබිම පළමුවැනි පරිච්ඡේදයෙහි දැක්වේ. දෙවැනි පරිච්ඡේදයෙන් සාහිත්‍ය විමර්ශන ඇසුරින් සකසා ගත් න්‍යායාත්මක පසුබිම විස්තර කරයි. දත්ත විශ්ලේෂණ තුන් වැනි පරිච්ඡේදය යටතේ ද නිගමන හා යෝජනා සිව්වැනි පරිච්ඡේදයෙන් ද ඉදිරිපත් කොට තිබේ.

පළමුවැනි පරිච්ඡේදය යටතේ ක්‍රම වේදය සහ අධ්‍යයන ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පසුබිම විස්තර කරයි. මෙහිදී අධ්‍යයනයේ අරමුණ, අධ්‍යනයේ වැදගත්කම, අධ්‍යයන ක්‍රම වේදය, පර්යේෂණයේ සීමාකම්, පර්යේෂණ නියැදිය, උපන්‍යාසය , දත්ත විශ්ලේෂණය කළ ආකාරය සවිස්තරව දක්වා ඇත. එමෙන්ම ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික පසුබිම යටතේ ක්ෂේත්‍රයේ භූගෝලීය පිහිටීම, සමාජ සංස්කෘතික පසුබිම විස්තර කරයි.

දෙවැනි පරිච්ඡේදයේ දී න්‍යායික පසුබිම විස්තර කරයි. මෙහිදී සමාජ විද්‍යාත්මකව පවුල යනු කුමක්දැයි පැහැදිළි කරයි. පවුලෙහි කාර්යයන් මොනවාදැයි තව දුරටත් විමසීමක් කර තිබේ. එසේම ගම යනු කුමක් ද, එහි ප්‍රභවය, ව්‍යුහය සහ විකාශය පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් අවධාරණය කර තිබේ. "අපගමනය" යන්න සමාජ විද්‍යාත්මකව විග්‍රහ කිරීම සඳහා ද අවස්ථාව සළසා ගෙන තිබේ. එමෙන්ම ආසියාවේ, යුරෝපයේ සහ ලංකාවේ පවුල් වල අපගමනික තත්වයන් විස්තර කිරීම සඳහා ද අවධානය යොමු කෙරුනි.

තුන්වැනි පරිච්ඡේදයේ දී නියැදිගත දත්ත විශ්ලේෂණය වේ. ඒ අනුව නියැදිගත පවුල් වල එකිනෙකෙහි පවතින සමාජයට අහිතකර වූ ප්‍රවණතාවන් මොනවා දැයි දත්ත ඇසුරින් විස්තර වේ. මෙහිදී ඒ ඒ පවුල් වල පවතින සමාජ ආචාර ධර්ම වලට පටහැනි ලෙස පෙනී යන ප්‍රවණතාවන් ලෙස දික්කසාද, වෙන්වී සිටීම, අතහැර යාම, අවජාතක දරුවන් සිටීද යනාදිය පිළිබඳව සොයා බලා ඇත. ඊට අමතරව පවුල් සමාජිකයින්ගේ කලහ කිරීම්, බීමත්කම, විවිධ අපරාධකාරී චර්යාවන්ට පෙළඹී තිබීම, හිංසනය, අපයෝජනයට ලක් කිරීම්, අනාචාරය, චිත්ත පීඩාවන්, විවාහ ජීවිතය සතුටින් ගත කර තිබේද, යනාදිය පිළිබව ගැඹුරින් තොරතුරු සොයා බැලීමක් සිදු කෙරුනි. හඳුනාගත් සුවිශේෂ අපගමනික තත්වයන් ප්‍රදර්ශනය කරනු ලබන පවුල් පිළිබඳව කේවල අධ්‍යයනයක් ලෙසින් වෙන වෙනම විමර්ශනයට භාජනය කොට තිබේ. ඒ අනුව ග්‍රාමීය පවුල් සංස්ථාව තුළ අතීතයේ සිට පැවති ශක්තිමත් කෘත්‍යයන් ලිහිල් වී යාමක් එනම් පවුල් සංස්ථාවේ සාමාජිකයන්ට සහ සමාජයට යම් අහිතකර තත්වයන් පෙන්නුම් කරන්නේ දැයි මේ යටතේ පරීක්ෂා කොට තිබේ.

සිව් වැනි පරිච්ඡේදයේ දී රැස් කර ගත් දත්ත කෙතෙක් දුරට උපන්‍යාසය සනාථ කරන්නේ දැයි විමසීමක් කෙරුනි. එම දත්ත තුළින් හඳුනාගත් ප්‍රජාව හා සම්බන්ධ ගැටලු මගහරවා ගැනීම හෝ අවම කිරීම සඳහා කල හැකි යෝජනා ද මේ යටතේ ඉදිරිපත් කරයි. පර්යේෂණයේ දී අනාවරණය කර ගත් තොරතුරු අනුව පවුල් සංස්ථාවේ ශක්තිමත් භාවය ලිහිල් කරන්නා වූ අපගමණික ප්‍රවණතාවන් මග හරවා ගැනීම සඳහා අදාළ අංශ වලට ද මෙම අධ්‍යයනය සමාජ විද්‍යාත්මකව වැදගත් කමක් ඇතැයි අදහස් කරයි.